# පුරාවිද්‍යාව හා ක්ෂේත්‍ර පුරාවිද්‍යාව

ඉනෝජ් කෞශල්‍ය අබේනායක

## පුරාවිද්‍යාව යනු කුමක් ද?

පුරාවිද්‍යාව යන්නට විවිධ අර්ථකථන ඇත. සංක්ෂිප්ත ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය දක්වන පරිදි පුරාවිද්‍යාව යනු ''විශේෂයෙන් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මෙන් ම කැණීම් මඟින් ලබා ගත් මානව පුරාවස්තු අධ්‍යයනය කිරීම වේ'' (7th edn, 1985). විෂය පිළිබඳ සාම්ප්‍රදායික දෘෂ්ඨිකෝණයකින් බලන වෙබ්ස්ටර් ජාත්‍යන්තර ශබ්දකෝෂයට අනුව (3rd edn, 1986) ''පුරාවිද්‍යාව යනු වඳ වී ගිය මානවයා හෝ අතීත මානවයාගේ සංස්කෘතික අවධීන් ඔස්සේ පොළොවෙන් මතු කර ගත් මිනිස් අස්ථි කොටස් හා වස්තූන් හරහා සිදු කරනු ලබන විද්‍යාත්මක අධ්‍යයනයක්'' ලෙස විග්‍රහ කරනු ලැබේ. විශේෂයෙන් පුරාවිද්‍යාව යන විෂය තුළ සාමාන්‍ය දෘෂ්ටිකෝණයෙන් දකින පුරාවිද්‍යාඥයන් නොවන පිරිස වුව ද 'අතීතය', 'ද්‍රව්‍යමය අවශේෂ' සහ 'කැණීම්' යන ඉතා වැදගත් කරුණු තුන ඔස්සේ විමසාබැලීමට උනන්දුවක් දක්වනු ඇත. කෙසේ වෙතත්, බොහෝ පුරාවිද්‍යාඥයින්ට, වචනයේ තේරුම සහ ඊට අදාළ විනය වඩාත් නම්‍යශීලී බවක් ගෙනෙන බැවින් විවිධ විග්‍රහයන්ට යොමු වන බව කිව යුතුය (Drewett 1999:1).

පුරාවිද්‍යාව තුළ ද්‍රව්‍යමය අංගයක් (Material Element) තිබිය යුතු බවට බොහෝ පුරාවිද්‍යාඥයින් එකඟ වේ. උදාහරණයක් ලෙස "පුරාවිද්‍යාවඃ මානව විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍රයක් ලෙස මානව අතීතය අධ්‍යයනය කිරීමේ දී ද්‍රව්‍යමය අවශේෂ ඔස්සේ අධ්‍යයනය කරනු ඇත" (Renfrew and Bahn 1991). එසේම මානව විද්‍යාව පමණක් ම නොව කලා ඉතිහාසය වැනි විෂය ක්ෂේත්‍රයක ද ගැටලු විසඳීමට, මිනිස් අවශේෂ භාවිත කරයි" (Rouse 1992). පුරාවිද්‍යාව, මානව විද්‍යාවට වඩා වෙනස් වන්නේ එය වෙනත් දේ වෙනුවට මානව

අවශේෂ අධ්‍යයනය කිරීම හා මානව ද්‍රව්‍යමය සංස්කෘතිය අධ්‍යයනය කිරීම නිසාය. පුරාවිද්‍යාව, ඉතිහාසයට වඩා වෙනස් වන්නේ, එයට ලිඛිත විස්තරයක් පමණක් නොව, අවශේෂ ද අධ්‍යයනය කිරීම නිසාය. මෙවැනි පසුබිමක් තුළ නැති වී හෝ වළදැමූ සියලු නටබුන් මතු කර ගැනීම සඳහා කැණීම් සිදු කිරීම අවශ්‍ය නොවේ. චීන මහා ප්‍රාකාරය හෝ ඇතන්ස්හි පාර්ටෙනන් හි නටබුන් හෙළිදරව් කිරීම සඳහා කැණීම් කටයුතු එතරම් අවශ්‍ය වී නොමැත (Drewett 1999:1).

පැහැදිලිවම, ද්‍රව්‍යමය අවශේෂ අධ්‍යයනය කිරීම වෙනත් විෂය ක්ෂේත්‍ර වනඃ මානව විද්‍යාව, කලා ඉතිහාසය හෝ ඉතිහාසය සඳහා ද භාවිතා කළ හැකි නමුත් පුරාවිද්‍යාත්මක ක්‍රමවේදය, න්‍යාය සහ අරමුණු මඟින් එය අනෙකුත් විෂය ක්ෂේත්‍රවලට වඩා වෙනස් බවට පත් කර ඇත. ඒ මන්ද යත්, ආර්ථික විද්‍යාඥයන් ගණිත ශිල්පීය ක්‍රම භාවිත කළ ද කිසිඳු ආකාරයකින් ගණිතය, ආර්ථික විද්‍යාවේ උප විෂයක් නොවේ. ඒ හා සමානව පුරාවිද්‍යාව මඟින් මානව විද්‍යාව හෝ ඉතිහාසය යන විෂයන් සඳහා දත්ත සැපයුව ද ඒවා කිසිඳු ආකාරයකින් මෙම විෂයයන්හි උප විෂයක් නොවේ. පුරාවිද්‍යාව යනු එයටම ආවේණික වූ න්‍යාය, ක්‍රමවේද සහ අරමුණු සහිත විෂයයකි (Drewett 1999:1).

පුරාවිද්‍යාඥයන් අතීත ජනයාගේ සමාජ හා සංස්කෘතීන්ගේ නටබුන් සමඟ නිතර කටයුතු කරයි. නමුත් මේ තුළ අවශේෂ නැතිවීම, වැළලීම සහ අමතක වී යාම වැනි ප්‍රවණතාවක් ඇති බැවින් පුරාවිද්‍යාව මඟින් එම අවශේෂ කොටස් නැවත මතුකර ගැනීම සඳහා ක්‍රමවේද පරාසයක් වර්ධනය කර ඇත. ඒ සඳහා ලබාගත් හා අනුවර්තනය කරන ලද ශිල්පීය ක්‍රම, ක්‍රමවේද සහ වෙනත් විෂයයන්ගෙන් ලබාගත් න්‍යායන් පවතින නමුත් ඒවා බොහෝ සෙයින් තමන්ගේ ම බවට පත් කර ගැනීමට පුරාවිද්‍යාඥයින් කටයුතු කරන ලදී. එබැවින් පුරාවිද්‍යාව මඟින් ද්‍රව්‍යමය අවශේෂ අධ්‍යයනය කිරීම සඳහා අතීතය පිළිබඳ අර්ථ විවරණයක් ලබා දීමට අනුවර්තනය හා විකාශනය කරන ලද තමන්ගේම මූලික න්‍යායන් යොදා ගනී.

පුරාවිද්‍යාව, ද්‍රව්‍යමය නටබුන් අධ්‍යයනය කිරීම තුළින් සිදුවන්නක් ලෙස සලකන්නේ නම්, පැහැදිලිව ම පුරාවිද්‍යාව මිනිස්

පැවැත්ම සහ ඊට පෙර අවධිය දක්වා ඉතා ගැඹුරින් හඳාරනු ලබන දැවැන්ත විෂයයක් බවට පත්වේ. තව ද භූගෝලීය වශයෙන් එය මුළු ලෝක ප්‍රදේශයමත් සදෙහි සහ අභ්‍යවකාශයේ නැතිවූ සියලු ප්‍රදේශයන් ආවරණය කරයි. මිනිසුන් විසින් ඉතිරි කර ඇති සියලු ම ද්‍රව්‍යමය අවශේෂ සඳහා සමාන වටිනාකමක් පුරාවිද්‍යාඥයන්ට නැත. එසේ අධ්‍යයනය කරන්නට ගියහොත් එමඟින් පුරාවිද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට හා ශික්ෂණයට නරක නමක් ලැබෙනු ඇත. යුරෝපයේ නව ශිලා යුගය හෝ පුරාතන උතුරු ඇමරිකානු යුගය වැනි කාල පරිච්ඡේදයක පුරාවිද්‍යාත්මක සන්දර්භය තුළ පවා සියලු ද්‍රව්‍යමය අවශේෂවලට සමාන අගයක් නොලැබුණි. සැතපුම් සියගණනක් අභ්‍යන්තරයේ ඇති පෘතුවි කබොළුවලට වඩා වෙරළබඩ භූමියක කැඩී ඇති කබොළු වලට අඩු වැදගත්කමක් තිබිය හැකිය (Drewett 1999:2).

බඳුනක් යනු කරුණකි. එය සැදූ ආකාරය, එය සෑදීමට යොදා ගත් දේ, සමහර විට එය නිර්මාණය කරන ලද ස්ථානය සාදන ලද සහ, අපද්‍රව්‍යවලින්, එහි අඩංගු දේ කිව හැකිය. එය සෑදූ දිනය කුමක්දැයි අපට සමහර විට පැවසිය හැකිය. එතැන් පටන් එය නව ශිලා යුගයේ ජීවිතය කෙබඳු වීද යන්න පිළිබඳ කතාවක් ගොඩ නගයි.

පුරාවිද්‍යාඥයන් භූමියේ ඇති අවශේෂ සොයා, ප්‍රවේශමෙන් තෝරාගෙන ඒවා සටහන් කරගනු ලබයි. පසුව එම අවශේෂ විශ්ලේෂණය කිරීමෙන් සහ විවිධ න්‍යායන් භාවිතයෙන් අතීතය පිළිබඳ කතාවක් ඉදිරිපත් කරයි. පුරාවිද්‍යාඥයන්ට සදහටම නැති වී ගිය අතීතය ප්‍රතිනිර්මාණය කළ නොහැක. නමුත් ඔවුන්ට කළ හැක්කේ අතීතයේ දී මෙන් යැයි උපකල්පනය කර කතන්දර හෝ අර්ථකථන මාලාවක් නිර්මාණය කිරීමයි. ඔවුන් මෙය සිදු කරන්නේ ඔවුන්ට හැකි ආකාරයෙන් අතීතය පිළිබඳ බොහෝ කරුණු එකතු කිරීමෙනි.

අතීතයේ එය කෙබඳුද යන්න පිළිබඳ කතාවක් ඉදිරිපත් කිරීමේ දී ද්‍රව්‍යමය නටබුන් සමඟ ස්වාභාවික භූමි දර්ශනය හා එකතුවුණු ස්වභාවික සංසිද්ධි අධ්‍යයනය කිරීම වඩා වැදගත් වේ. පුරාවිද්‍යාඥයන් විසින් ස්වාභාවික නටබුන් සන්දර්භය තුළ පවතින තොරතුරු ඉදිරිපත්

කළ යුතුය. ඔබ වනාන්තරයක, තෘණ භූමියක, ගඟක් අසල හෝ වෙරළ තීරයක ජීවත් වී ඒ පිළිබඳ ඉගෙන ගන්නවානම් නම් මෙම පාරිසරික සන්දර්භය පාරිසරික පුරාවිද්‍යාවේ විෂය ක්ෂේත්‍රය තුළින් අධ්‍යයනය කළ හැකිය. මිනිසා පිළිබඳ කතාවට සහ පරිසරය පිළිබඳ කතාවට කරුණු, න්‍යායන් සහ අර්ථ නිරූපණයන් ඇත. නමුත් අතීතය පිළිබඳ අර්ථ නිරූපණයන්, ඒවායේ විකාශනයන් (පරිණාමයන්) පිළිබඳ න්‍යායන් හෝ අර්ථකථන අඩංගු නොවන්නේ නම් අතීතයේ සිදුවීම්වලට කිසිදු වටිනාකමක් ලැබෙන්නේ නැත (Drewett 1999:2).

**ක්ෂේත්‍ර පුරාවිද්‍යාව යනු කුමක්ද?**

පුරාවිද්‍යා ගවේෂණ හා කැණීම් මගින් අතීත මානවයාගේ ද්‍රව්‍යමය සංස්කෘතිය නැවත ප්‍රතිනිර්මාණය කිරීම සහ ඊට අදාළ කරුණු විශ්ලේෂණය කිරීම ක්ෂේත්‍ර පුරාවිද්‍යාව යටතේ මූලිකව සිදු කෙරේ. වචනාර්ථයට අනුව ක්ෂේත්‍ර පුරාවිද්‍යාව යනු ක්ෂේත්‍රය තුළ සිදුකරන පුරාවිද්‍යාත්මක ක්‍රියාකාරකම් ලෙස අර්ථ ගැන්වෙන බවක් පෙන්නුම් කෙරේ. නමුත් පුරාවිද්‍යාඥයන් ක්ෂේත්‍රයේ කරන දේ පමණක් නොව ඊට අදාළ සහ සමගාමී කටයුතු ද ක්ෂේත්‍ර පුරාවිද්‍යාව තුළින් අර්ථ ගැන්වේ. එබැවින් එයට සැලකිය යුතු පූර්ව-ක්ෂේත්‍ර මූලිකාංගයක් සහ ඊටත් වඩා සැලකිය යුතු පශ්චාත්-ක්ෂේත්‍ර මූලිකාංගයක් ඇතුළත්ව ඇත. ඇතැම් විට ක්ෂේත්‍ර පුරාවිද්‍යාව යන යෙදුම පුරාවිද්‍යාඥයන් භාවිත කරනුයේ ශිල්පීය ක්‍රම හඳුන්වාදීම සඳහා පමණි. කැණීම් යනු ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන්ට යොදා ගත හැකි එක් තාක්ෂණික මෙවලමකි. කැණීම් අවශේෂ වඩාත් සවිස්තරාත්මක මෙන්ම වඩාත්ම විනාශකාරී වන අතර එය ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයාට වඩාත්ම වැදගත් තොරතුරු සහ තාක්ෂණය ද සපයයි (Drewett 1999:3, Greene 1995:58-60).

ක්ෂේත්‍ර පුරාවිද්‍යාව ආරම්භ වන්නේ පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රයකිනි (Field archaeology starts with the location of archaeological sites). බොහෝ පුරාවිද්‍යාඥයන් මෙම ප්‍රදේශ දකින්නේ බොහෝ කෞතුක වස්තු ඇති ස්ථාන ලෙස ය. එම ස්ථානවල කිසියම් කාල පරිච්ඡේදයකට අයත් මිනිසා විසින් සාදන ලද ව්‍යුහයන්, ද්‍රව්‍යයන් මෙන් වෙනත් අවශේෂ ලක්ෂණ දැකගත හැකිය. තව ද එම ප්‍රදේශ තුළ හෝ අවට මානව වෙනස් කිරීම්

සහිත ස්වාභාවික පරිසරයක් ද පවතී. ඒ පිළිබඳ අවධානයෙන් සිටීම ද වැදගත් වේ. පැහැදිලිවම පුරාවිද්‍යා ස්ථානයක්/ක්ෂේත්‍රයක් යනු විශේෂ මානව ක්‍රියාකාරකම් සහිත ද්‍රව්‍යමය අවශේෂයන්ගෙන් සමන්විත වූ නිශ්චිත භූමි ප්‍රදේශයක් ලෙස හඳුන්වාදිය හැකිය.

පෘථිවියේ මුළු මතුපිට ම මානව නිෂ්පාදිත අවශේෂ සහිත පුරාවිද්‍යාත්මක ප්‍රදේශ දැකගත හැකිය. අවශේෂ නොමැති ප්‍රදේශ පවා මානව කතාවේ කිසියම් පරිච්ඡේදයකි. හිස් ප්‍රදේශයක් හෝ තනි ප්‍රක්ෂේපණ ලක්ෂ්‍යයක් (Single projectile point) සමහරවිට අවම දත්ත ප්‍රමාණයක් සපයයි. ඉහළ අවධානයක් සහිත පුරාවස්තු, විශේෂාංග සහ නවීකරණය කරන ලද පරිසරය (high concentrations of artefacts, features and a modified environment) අතීතය පිළිබඳ විශාල දත්ත ප්‍රමාණයක් සපයයි. එවැනි අවස්ථාවක ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන් විසින් සලකා බැලීමට අවකාශ ඇති ක්ෂේත්‍ර ලෙස මේවා හඳුනාගත හැකිය (Drewett 1999:3).

ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන් සලකා බැලීමට අවශ්‍යය වන ක්ෂේත්‍ර පුරාවිද්‍යාවේ අංග මොනවාද? එමෙන් ම පැහැදිලිව ම පුරාවිද්‍යාඥයෙක් වීමට ක්ෂේත්‍රයට පිවිසීම අනිවාර්යය ද? යන්න ගැටලු මතු වේ. ඇතැම්විට සෑම කෙනෙකුට ම ක්ෂේත්‍රයට ගොස් ඒ සඳහාම යෙදෙමින් කටයුතු කිරීමට අවස්ථාව හිමි නොවේ. ඔවුන් සෘජුව ම ක්ෂේත්‍ර පුරාවිද්‍යාවේ නිරත නොවුන ද ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන් ලෙස හඳුන්වන්නේ ඔවුන් පර්යේෂණ ක්ෂේත්‍රයට කරන දායකත්වය නිසාවෙනි.

ක්ෂේත්‍ර පුරාවිද්‍යාවේ පළමු අංගය වන්නේ ව්‍යාපෘති සැලසුම් කිරීමයි (The first element of field archaeology is therefore to design the project). මෙම අදහස පළමුව සඳහන් කිරීමෙන් ම කෙනෙකු තුළ කිසියම් ගැටලුවක් නිර්මාණය කිරීමේ අවකාශයක් මතුවනු ඇත. හුදෙක් සාම්ප්‍රදායික සාංකල්පික මත ඔස්සේ අර්ථ දක්වන බොහෝ පිරිස් ක්ෂේත්‍ර පුරාවිද්‍යාවේ මූලික අංගයන් සඳහන් කළ සැනින් කැණීම්, ගවේෂණ ආදීය පහසුවෙන් ම ඉදිරිපත් කර විග්‍රහ කිරීමට පෙළෙඹෙනු නිසැකය. නමුත් සෑම කැණීමක්, සහ ගවේෂණයක් සිදුකිරීමට පළමුව අප කළ යුතු ක්‍රියා පිළිවෙත ක්ෂේත්‍ර

පුරාවිද්‍යාවෙන් බැහැර කළ හැකිද යන ප්‍රශ්නය අප විමසිය යුතුය. පර්යේෂණ සැලසුමක් නිර්මාණය කිරීම ද මෙයට සම්බන්ධ වේ. ව්‍යාපෘතියට පොදු හැඳින්වීමක් ලබා දීම මෙහි පළමු පියවර වේ (Drewett 1999:4). මෙමඟින් ව්‍යාපෘති ප්‍රදේශය සිතියමක ස්ථානගත කිරීම වඩාත් සුදුසුය. මෙම හැඳින්වීම තුළ පුරාවිද්‍යාත්මක ප්‍රදේශයේ හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු සහ ප්‍රදේශයේ ඇති නීතිමය සීමාවන් ඇතුළත් විය යුතුය. පර්යේෂණ සැලසුම සකස් කිරීමට පෙර ඉඩම් හිමියා සහ ව්‍යවස්ථාපිත බලධාරීන් සමඟ මූලික සාකච්ඡා පැවැත්වීම සාමාන්‍යයෙන් ප්‍රයෝජනවත් වේ. ඔබට හුදෙක් ඉඩමට ප්‍රවේශ වීමට ඉඩ නොදෙන්නේ නම්, පර්යේෂණ සැලසුමක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමට යාමේ දී යම් බලපෑමක් ඇතිවේ.

පර්යේෂණ සැලසුමේ දෙවන අංගය ලෙස එම ප්‍රදේශයේ පූර්ව පර්යේෂණ සලකා බැලීමය (Drewett 1999:5). කැණීම් යනු නැවත කළ නොහැකි අත්හදා බැලීමකි. කැණීම්, ඉහළ ම ප්‍රමිතියෙන් වුව ද පුරාවිද්‍යාත්මක තොරතුරු විනාශ විය හැකිය. ස්වාභාවිකව ම, ක්ෂේත්‍රයේ පූර්ව පර්යේෂණ සලකා බැලීමේ දී එහි ගුණාත්මක භාවය තක්සේරු කිරීමට මත තබා ගත යුතුව ඇත. එකල නොතිබූ ශිල්පීය ක්‍රම දැන් තිබේද? යන්න සලකා බැලිය යුතු ප්‍රධාන කරුණකි. පාරිසරික සාම්පල එකතු කිරීමට පෙර මෙම ප්‍රදේශය භාරා තිබේ ද? දින වකවානු? යනාදී පෙර කාර්යයන් සියල්ල මත පදනම්ව පර්යේෂණය කළ යුතුය. තුන්වන කොටස සඳහා ප්‍රදේශයේ හෝ කලාපයේ පෙර කාර්යයන්වල අනුක්‍රමය ගෙනහැර දැක්වීම වඩා වැදගත් වේ. මෙය ව්‍යාපෘතියක ආරම්භක ස්ථානය බවට පත් වනු ඇත.

පර්යේෂණ සැලසුමේ සිව්වන හා වඩාත්ම වැදගත් අංගය ව්‍යාපෘතියේ අරමුණු සහ වැදගත්කම දැක්වීමය. (ibid) මෙය සෑම අවස්ථාවක ම වෙනස් වන අතර පුළුල් හා විශේෂිත ප්‍රශ්න ඊට සම්බන්ධ විය හැකිය. කෙසේ වෙතත්, ව්‍යාපෘති සැලසුම පිළිබඳ සැලකිලිමත් විය යුතුය. ඔබේ සැලසුම කෙතරම් පරෙස්සම් වුවත්, ක්ෂේත්‍ර කටයුතු අනිවාර්යයෙන් ම අපේක්ෂිත තොරතුරු සහ ප්‍රශ්න ඉවත දමනු ඇත. ඉතිහාසය හෝ මානව විද්‍යාව වැනි පුරාවිද්‍යාව හා සම්බන්ධ වෙනත් විෂයයන්ට වඩා වෙනස් වන්නේ මෙහි දී ය.

පහළොස්වන සියවසේ යුරෝපයට අයත් ලොම් වෙළඳාම පිළිබඳ සාක්ෂි සොයන ඉතිහාසඥයෙකුට දහහත්වන සියවසේ ලොම් වෙළඳාම හෝ පහළොස්වන සියවසේ මැටි වෙළඳාම පිළිබඳව ඔහු හෝ ඇය දක්වා ඇති සඳහනක් සාධාරණ ලෙස නොසලකා හැරිය හැකිය. නමුත් ක්ෂේත්‍රයේ වැඩ කරන පුරාවිද්‍යාඥයකුට මෙය කළ නොහැක. භූමියේ හෝ භූමියේ මතුපිට තිබෙන සාක්ෂි ඉවත් කළහොත් සදහටම එය නැතිවී යයි. ඉතිහාසඥයින්ට පසුව ලේඛන ආපසු විමසා බැලීමට හැකි වුවද පුරාවිද්‍යාඥයින්ට නැවත කියවීම සඳහා තැනින් තැන දත්ත සොයා විමසා බැලීමට නොහැක. එබැවින් අරමුණු හා වැදගත්කම නැවත ව්‍යාපෘතිය සැලසුම් කිරීමට ප්‍රමාණවත් ලෙස නම්‍යශීලී විය යුතුය. ක්ෂේත්‍ර පුරාවිද්‍යාවට නම්‍යශීලීභාවය අවශ්‍ය වේ. ඉතා දෘඩ පර්යේෂණයක් සැලසුම් කිරීම ව්‍යසනයකට තුඩු දෙයි. අවාසනාවට සමහර අරමුදල් සපයන ආයතන බොහෝ විට ඉතා දෘඩ පර්යේෂණ සැලසුම් සඳහා පිවිසේ. මෙම සැලසුම් බොහෝ විට පුරාවිද්‍යාවට වඩා මූල්‍ය පාලනයට තදින් සම්බන්ධ වේ.

අරමුණු සහ වැදගත්කම මොනවාදැයි තීරණය කිරීමෙන් පසු, පර්යේෂණ සැලසුමක පස්වන අංගය ලෙස ක්ෂේත්‍ර පුරාවිද්‍යා ව්‍යාපෘතිය මඟින් එහි ක්‍රමවේදය ආවරණය කළ යුතුය. අරමුණු සහ වැදගත්කම සාක්ෂාත් කරගන්නේ කෙසේද සහ පර්යේෂණ ප්‍රදේශයට අදාළ කිරීමට යන්නේ කුමන ශිල්ප ක්‍රමද? යනාදිය වෙත අවධායන යොමු කළ යුතුය. ක්ෂේත්‍ර පුරාවිද්‍යා ව්‍යාපෘතියක ක්ෂේත්‍ර මූලිකාංග වැඩ සඳහා වැය කරන කාලය ඇත්ත වශයෙන්ම මුළු ව්‍යාපෘතිය සඳහා වැය කරන කාලයෙන් කුඩා කොටසකි. මුළු ව්‍යාපෘතිය සඳහා වැය කරන කාලයෙන් වැඩි ප්‍රමාණයක් පශ්චාත්-ක්ෂේත්‍ර වැඩ විශ්ලේෂණය සහ ප්‍රකාශනය පිළිබඳ විය යුතුය.

එබැවින් පශ්චාත් ක්ෂේත්‍ර කටයුතු හෝ පශ්චාත් කැණීම් සහ ප්‍රකාශන වැඩසටහන පර්යේෂණ සැලසුමේ හයවන අංගය විය යුතුය (Drewett 1999:6). තවමත් ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කර හෝ පර්යේෂණ ප්‍රදේශය කැණීම් කර නොමැති බැවින්, සොයාගත හැකි දේ පිළිබද තවම අදහසක් නොමැත. නමුත් අත්දැකීම් සමඟ, සාමාන්‍යයෙන් සොයා ගත හැකි දේ පිළිබඳ නිවැරදි චිත්‍රයක් පුරෝකථනය කළ හැකිය. පේලියොලිතික් භූමියක දී ශිලා ආයුධ

හමුවනු ඇත, නමුත් මැටි භාණ්ඩ නැත. අම්ල සහිත ප්‍රදේශයක කාබනික ද්‍රව්‍ය විනාශවිය හැකිය. යම් ප්‍රදේශයක් ජලයෙන් යටවී ඇත්නම් එම ප්‍රදේශයේ කාබනික ද්‍රව්‍ය නොනැසී පවතිනු ඇත. ඔබ සොයාගත් දත්ත සැමවිටම ජනතාව වෙතට පැමිණිය යුතු ය. ඔබ උමතුවෙන් මෙන් එම දත්ත කාටවත් නොපෙන්වා නොදී තබා ගැනීම පහත් ගති පැවතුමක් ලෙස සැලකේ.

ඕනෑම ක්ෂේත්‍ර පුරාවිද්‍යා ව්‍යාපෘතියක් සඳහා පර්යේෂණ සැලසුමක අවසාන අංගය ලෙස කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා, කාලය සහ මුදල් පිළිබඳව සලකා බැලිය යුතුය (ibid). මෙය සැබෑ ලෝකයේ අවශ්‍යතාවයකි. පාලමක් ඉදිකරන්නේ නම් ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ විවිධ දේ සඳහා කොපමණ කාලයක් ගතවේද යන්න නිවැරදිව නිශ්චය කළ හැකිය. කැණීමේදී ඔබට අර්ථ දැක්විය හැක්කේ පුළුල් පරාමිතීන් පමණි. වියළි ප්‍රදේශයක් හදිසියේම සංරක්ෂිත කාබනික පුරාවස්තු අඩංගු ප්‍රදේශයක් වීමේ අවස්ථාව ඇතිවිය හැකිය. කැණීමේ පිරිවැය එක රැයකින් දෙගුණ විය හැක. එබැවින් ඔබේ කාර්ය මණ්ඩලය, අයවැය සහ කාලසටහන නම්‍යශීලීව තබා ගත යුතුය.

**ක්ෂේත්‍ර පුරාවිද්‍යාව සිදු කරන්නේ කවුද?**

ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන් පුළුල් ලෙස කණ්ඩායම් තුනකට බෙදිය හැකිය. සැබැවින් ම පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදුකරන පිරිස්, සංස්කෘතික සම්පත්වල කළමනාකරණය පිරිස් සහ විනෝදය සඳහා එය කරන පිරිස් ය. මෙම කණ්ඩායම් තුන ම පුරාවිද්‍යාවට විශාල දායකත්වයක් ලබා දේ. එක් කණ්ඩායමක් බොහෝ විට තවත් කණ්ඩායමක් ගැන විවිධ අදහස් ප්‍රකාශ කළ ද, කණ්ඩායම් තුන ම හොඳ, නරක සහ උදාසීන ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත වේ. කණ්ඩායම් තුනම පුරාවිද්‍යාත්මක දැනුම කෙරෙහි උනන්දුවක් දක්වන අතර එම නිසා වස්තූන්ගේ මූල්‍ය වටිනාකම් කෙරෙහි ප්‍රධාන උනන්දුවක් දක්වන නිධන් හොරුන්ගෙන් පැහැදිලිවම වෙනස් වේ. වස්තුවක සන්දර්භය ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන් දැනුම මත විවිධ අර්ථකථන මතින් වෙනස් කරයි. කෙසේ වෙතත්, නිධන් හොරුන් එහි සන්දර්භය ගැන උනන්දු වන්නේ වස්තුවේ වටිනාකම මතය. ඔවුන් කිසිවෙටකත් ලබාගත් අත්දැකීම් හෝ දැනුම මහජනතාව වෙත ලබා

දීමට උනන්දුවක් නොවේ (Drewett 1999:7).

ශුද්ධ ක්ෂේත්‍ර පුරාවිද්‍යාවට (Pure field archaeology) සම්බන්ධ ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන්ගේ කණ්ඩායම කුඩා වුව ද සාමාන්‍යයෙන් ඔවුන් ඉතා පුළුල් පුරාවිද්‍යා ව්‍යාපෘතීන්වල නිරත වේ. ඔවුන් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් හෝ මහාචාර්යවරුන් හෝ සමහර විට කෞතුකාගාර භාරකරුවන් විය හැකිය. ඔවුන්ගේ ව්‍යාපෘති සඳහා අරමුදල් ප්‍රධාන වශයෙන් ජාතික විද්‍යා පදනම් හරහා සපයයි. උදාහරණයක් ලෙස British Academy in Britain iy National Science Foundation in America හඳුන්වා දිය හැතිය. සමහර විශ්වවිද්‍යාල සහ කෞතුකාගාරවල ක්ෂේත්‍ර පුරාවිද්‍යාව සඳහා සීමිත අරමුදල් තිබේ. මෙම කණ්ඩායමට ක්ෂේත්‍ර ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා න්‍යායාත්මකව පර්යේෂණ ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සැපයීම සඳහා දැනුම, කාලය සහ සම්පත් තිබිය යුතුය. නමුත් යථාර්ථය නම් බොහෝ විට සීමිත සම්පත්, ප්‍රමාණවත් නොවන කාලය හා අඩු සහයෝගය මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සිදුවීමයි. එබැවින් ඔවුන්ට බොහෝ විට විකල්ප අරමුදල් ප්‍රභවයන් වෙත ප්‍රවේශය ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර පාසල් හා වෙනත් කුඩා ව්‍යාපෘතීන් වෙත යාමට සිදුවේ.

**සංස්කෘතික/පුරාවිද්‍යා සම්පත් කළමනාකරණය සහ ක්ෂේත්‍ර පුරාවිද්‍යාව**

ක්ෂේත්‍ර පුරාවිද්‍යාව සංස්කෘතික සම්පත් කළමනාකරණයේ අත්‍යවශ්‍ය අංගයකි. එය බ්‍රිතාන්‍යයේ ප්‍රසිද්ධ වී ඇත්තේ පුරාවිද්‍යා සම්පත් කළමනාකරණය ලෙසයි (ibid). එය පුරාවිද්‍යාවේ වෙනත් ඕනෑම ප්‍රදේශයකට වඩා ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන් වැඩි ප්‍රමාණයක් සේවයේ යොදවයි. සංස්කෘතික සම්පත් කළමනාකරණය සඳහා මූලික අංග පහක් ඇත. සම්පත සොයා ගන්නා තෙක් එය කළමනාකරණය කළ නොහැක. එබැවින් ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන් එම සම්පත් පිහිටි ස්ථාන සොයා ගැනීමට අවශ්‍ය වේ. මේ සඳහා දැනට පවත්නා දැනුම තුළින් කලාපයේ පවත්නා ගුවන් ඡායාරූප විශ්ලේෂණය කිරීම සලකා බලනු ලබයි. කැණීම් වැනි ශිල්පීය ක්‍රම මගින් සම්පත්වල වටිනාකම අඩු විය හැකි බැවින් (කැණීම භූමිය විනාශයකි) භාවිත කරන ශිල්පීය

ක්‍රම විනාශකාරී නොවන ශිල්පීය ක්‍රම විය යුතුය. සම්පත සොයාගත් පසු සංස්කෘතික සම්පත් කළමනාකරුවන් විසින් පරිශීලක-හිතකාමී, නමුත් පහසුවෙන් වැඩි දියුණු කළ හැකි ක්‍රමයක් ලෙස සම්පත්වල ස්ථාන නිර්ණය කළ යුතුය. මේ සඳහා කිසියම් ආකාරයක ක්‍රමවේදයක් අවශ්‍ය වේ. එබැවින් ඒ සඳහා ස්මාරක හා ස්ථාන පිළිබඳ වාර්තාවක් පිළියෙළ කිරීම වැදගත් වේ (Sites and Monument Record).

බ්‍රිතාන්‍යයේ බොහෝ ස්ථාන සහ ස්මාරක වාර්තා ප්‍රාන්ත මට්ටමින් පවත්වාගෙනනු ලබන අතර ඉතා ඉක්මනින් දත්ත ලබා ගැනීම, යොමු කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමානුකූලව පරිගණක ගත කර ඇත. බ්‍රිතාන්‍යයේ ද ජාතික ස්මාරක වාර්තාවක් (Non-intensive National Monuments Record (NMR) ඇත. එය ඔවුන්ගේ ලන්ඩන් කාර්යාලයේ පරිගණක පර්යන්ත හරහා ප්‍රවේශ විය හැකිය.

සම්පත් සොයා ගැනීම සහ සම්පත්වල ස්ථාන නිර්ණය කිරීමෙන් පසු (අඛණ්ඩ ක්‍රියාකාරකමක් ලෙස) සංස්කෘතික සම්පත් කළමනාකරුවන් විසින් සම්පත් භාවිතය සහ ආරක්ෂාව සහ ඒවා අවම කිරීමේ ක්‍රියා පටිපාටි සලකා බැලිය යුතුය. සියලු ම අංග ක්‍රියාත්මක කිරීම සඳහා ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන් අවශ්‍ය වේ. නෛතික හා ප්‍රායෝගික ආරක්ෂාව සම්පත්වලට (ස්මාරක හා ස්ථාන) අවශ්‍ය වේ. ලෝකයේ බොහෝ රටවල සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම අරමුණු කර නීති සම්පාදනය කර ඇත.

මීට අමතරව සංවර්ධනය තුළින් හෝ ස්වාභාවික ක්‍රියාවලි තුළින් පුරාවිද්‍යා ප්‍රදේශවලට තර්ජනයක් ඇති විය හැකිය. සංවර්ධන ක්‍රියාවලි බොහෝ විට පුරාවිද්‍යා ප්‍රදේශවලට විශාලතම බලපෑමක් ඇති කරයි. එසේ ම මෙම ප්‍රදේශය ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයන්ගේ විශාලතම රැකියාව බවට පත් වේ. ක්ෂේත්‍ර පුරාවිද්‍යා ගවේෂණ සිදු කිරීම සඳහා පුරාවිද්‍යා හානි ඇගයුම් හරහා විශාල මුදල් ප්‍රමාණයක් බොහෝ විට ඔවුන්ට වෙන්ව ඇත.

ක්ෂේත්‍ර පුරාවිද්‍යාව කරන තුන්වන කණ්ඩායම එය විනෝදාංශයක් ලෙස කරන අයයි. ඔවුන් බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාවේ සාම්ප්‍රදායික ආධුනිකයන් ලෙස සැලකේ. ඔවුන් බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාවේ

ප්‍රාන්ත පුරාවිද්‍යාත්මක කටයුතුවලට ද සහභාගි වේ. සසෙක්ස් පුරාවිද්‍යා සංගමයේ සාමාජිකයින් 2,000 කට අධික සංඛ්‍යාවකින් යුක්තය. සමහරු වෘත්තීය පුරාවිද්‍යාඥයන් හා තවත් අය සමඟ ක්ෂේත්‍රයේ වැඩ කරති. ඔවුන්ගේ දායකත්වය බ්‍රිතාන්‍ය වැනි රටවල මහත් ඉහළින් අගය කරයි. නමුත් බොහෝ රටවල ආධුනික ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින්ට පුරාවිද්‍යා කටයුතු සඳහා පිවිසීමට නොහැකිය.

**ක්ෂේත්‍ර පුරාවිද්‍යාවේ න්‍යායාත්මක පදනම**

කැණීමක යෙදී සිටින නවක සාමාජිකයා පවා පළමු වරට බිම හෑරීම න්‍යායාත්මක රාමුවක් තුළ හිඳිමින් සිදු කිරීම කළ යුතු බව ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීම වේ. එසේ නොවේ නම්, ඔවුන් හුදෙක් නිධන් හොරුන් වනු ඇත (Trigger 1994). මෙම අදහස් පශ්චාත් පුරාවිද්‍යා න්‍යායන් මගින් විශ්ලේෂණයට භාජනය කර ඇත. ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් ප්‍රථමයෙන් හා ප්‍රධාන වශයෙන් දත්ත සමඟ එනම් මැටි කැබලි; කැලි කැඩුණු ගල්; භූමියේ වටකුරු ව්‍යුහයන්, රේඛීය සහ ඕවලාකාර සිදුරු; සමහර විට කුඩා ගල් ගොඩවල් සමඟ කටයුතු කරයි. කැණීම්කරු භූමිය හෙළිදරව් කිරීමට පටන් ගත් මොහොතේ සිට අර්ථ නිරූපණ ක්‍රියාවලිය ආරම්භ කරයි. ගිනිගත් මැටි කැබලි, භාජන බවට පත්වේ; කැඩුණු ගල්, අත් පොරොව බවට පත්වේ; රේඛීය සහ ඕවලාකාර සිදුරු පශ්චාත් කුහර, වළවල් ගබඩා වලවල් බවට පත්වේ. ගල් ගොඩවල් බිත්ති බවට පත්වේ.

න්‍යායාත්මක පුරාවිද්‍යාව වඩාත් ඉතා සංක්ෂිප්තව ආරම්භ වන නමුත් එය අවසන් වන්නේ ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් සිදු කරන සියල්ලට ම බලපෑම් කිරීමෙනි. පදනම්වල සීමාවන් සහ හේතුවල වලංගුභාවය ආදිය ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් විසින් විමසන මූලිකාංග යන් ය. ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් ඔහු හෝ ඇය කියා සිටින දේ සනාථ කරනවාද? විශේෂයෙන් එක්සත් ජනපදයේ, නව පුරාවිද්‍යාව ලෙස හැඳින්වූ උපකල්පනයන් (hypotheses) සනාථ කිරීමට හෝ සනාථ නොකිරීමට හැකියාවක් ඇතැයි විශ්වාස කිරීමට මූලික වශයෙන් යොදා ගනු ලබන්නනේ රසායනික අත්හදා බැලීම් ය. මෙම පුරාවිද්‍යාඥයින්, සමහර විට ධනාත්මකවාදීන් (positivists) ලෙස හඳුන්වනු ලබන්නේ, පුරාවිද්‍යා න්‍යාය සත්‍ය හෝ අසත්‍ය බව ඔප්පු කිරීමට එය පරීක්ෂා කළ හැකි බව කියා සිටි බැවිනි (Binford and Binford 1968).

සමහර පුරාවිද්‍යාඥයින් අතීතය නැති වී ගොස් ඇති හෙයින් ඒ පිළිබඳ අදහස් සත්‍යය ද අසත්‍ය ද යන්න ඔප්පු කළ නොහැකි බව පවසයි. ගල්වලින් පිරුණු කුඩා වටකුරු සිදුරක කාර්යය (පශ්චාත් සිදුරක්) කිසි විටෙකත් ඔප්පු කළ නොහැකි බව ඇතමුන් අදහස් දක්වයි. අතීතය ගැන පවතින අදහස අසත්‍යය බවත් නමුත් එය සත්‍ය බව කිසිවෙකුට සැබවින් ම ඔප්පු කළ නොහැකි බව සමහරු පවසති. බොහෝ අවස්ථාවල ගල්වලින් පුරවා ඇති වටකුරු සිදුරු, හතරැස් හෝ ඍජුකෝණාස්‍රාකාර රටා අනුව සොයා ගත් පසු ඒවා දැව ගොඩනැගිලි බව අප විසින්ම විනිශ්චය කරනු ඇත. ඒ කෙසේ වෙතත්, ඇත්ත වශයෙන් ම අප සොයාගත් ගල්වලින් පිරුණු කුඩා වටකුරු සිදුරු හතරැස් හෝ හතරැස් රටා නොවන බව ඔප්පු කිරීම දුෂ්කර වනු ඇත (Drewett 1999:9).

පුරාවිද්‍යාවට සංස්කෘතික-ඓතිහාසික ප්‍රවේශයක් හඳුන්වාදීමට පුරාවිද්‍යාඥයන් උස්සාහ ගන්නේ සාම්ප්‍රදායික ඉතිහාසඥයන් භාවිත කළ ප්‍රවේශයන් හරහාය. ලිවීමක් නොමැති කාලපරිච්ඡේදයකට ඉතිහාසය නැවත ප්‍රක්ෂේපණය කිරීමේ ක්‍රමය පුරාවිද්‍යාව ය. සංස්කෘතික-ඓතිහාසික ප්‍රවේශය මගින් දත්ත යොදා ගෙන න්‍යායන් විස්තර කිරීම සහ පරීක්ෂා කිරීම සිදු කරයි. මෙම ප්‍රවේශය සඳහා අත්‍යවශ්‍ය වන්නේ සවිස්තරාත්මක සංස්කෘතික දත්ත එක්රැස් කිරීමයි. එනම් භාජන, ලෝහ වැඩ, නිවාස සැලසුම් සහ ඒ හා සමාන, සහ ඒවායේ වර්ගීකරණයන් ය. මෙම දත්ත ගබඩාවෙන් පුරාවිද්‍යාත්මක සංස්කෘතීන් නිර්වචනය කළ හැකිය.

සංස්කෘතික-ඓතිහාසික ප්‍රවේශය සඳහා ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් විසින් පුරාවස්තු හා ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සැපයිය යුතුය. දහනව වන සියවසේ දී ජෙනරාල් පිට්-රිවර්ස් වැනි පුරෝගාමීන් විසින් පුරාවිද්‍යාත්මක ස්ථානවල වළවල් වැනි පුරාවිද්‍යාත්මක ලක්ෂණ නිවැරදි ලෙස හඳුනාගෙන සිරස් අක්ෂයක් හරහා පර්යේෂණ කළේය. සංස්කෘතික-ඓතිහාසික ප්‍රවේශයේ දී පුරාවිද්‍යාඥයින් විසින් යම් යම් දේ කිරීමේ දී දැන හෝ නොදැන ඔහු හෝ ඇය වැඩ කරන්නේ න්‍යායාත්මක රාමුවක් තුළ ය.

ක්ෂේත්‍ර ශිල්පීය ක්‍රම නොවැළැක්විය හැකි ලෙස අතිච්ඡාදනය වුවත් ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින්, සංස්කෘතික-ඓතිහාසික රාමුවක් තුළ වැඩ කරන අයට වඩා වෙනස් ලෙස එනම් නව න්‍යායාත්මක රාමුවක් තුළ දී කටයුතු කරනු ලැබේ. සංස්ලේශවාදී පුරාවිද්‍යාව (Processual archaeology) මගින් මානව සංස්කෘතිය සහ පරිසරය අතර අන්තර්ක්‍රියා අවධාරණය කිරීම සහ සංස්කෘතික වෙනස අවබෝධ කර ගැනීම සඳහා නිතරම කටයුතු කරයි. මෙම න්‍යායාත්මක රාමුව තුළ වැඩ කරන විට සාම්ප්‍රදායික සංස්කෘතික-ඓතිහාසික පුරාවිද්‍යාඥයින් විසින් දත්තවලට ලබා දුන් වැදගත්භාවයට වඩා සෑම දත්තයක් ම (බීජයක්, කවචයක් සහ අස්ථි) අත්‍යවශ්‍ය දත්ත බවට පත්කර තිබේ. අතීතය පිළිබඳ උපකල්පන පරීක්ෂා කළ හැකි බැව් විශ්වාස කරන සංස්ලේශවාදී පුරාවිද්‍යාඥයින්, ධනාත්මකවාදීන් ලෙස සැලකේ. මූලික වශයෙන් සංස්ලේශවාදී පුරාවිද්‍යාඥයින් ඔවුන් ලබාගත් සමහර දත්තවල දෘෂ්ටිවාදාත්මක හා සංකේතාත්මක (Ideological and symbolic nature) ස්වභාවය බොහෝ දුරට නොසලකා හැර තිබේ. නමුත් මෙම ස්වභාවය සංස්ලේශවාදී පුරාවිද්‍යාඥයින් විසින් ඥානාත්මක සංස්ලේශවාදී පුරාවිද්‍යාව (Cognitive-processual Archaeology) ලෙස යොමු කර ඇත. සංස්ලේශී පුරාවිද්‍යාව බ්‍රිතාන්‍යයේ සහ ඇමරිකානු ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් අතර ප්‍රමුඛ න්‍යායාත්මක රාමුවකින් පවතී.

සමහර පුරාවිද්‍යාඥයින් සඳහා, සංස්ලේශී පුරාවිද්‍යාව මගින් දත්ත සොයා ගත හැකි ක්‍රමයන්ට බොහෝ සීමාවන් පනවා ඇත. අතීතයේ පුද්ගලයාගේ සහ පුද්ගල ක්‍රියාවන්ගේ වැදගත්කම බැහැර කිරීම සඳහා දත්තවලින් පුළුල් නීති ලබා ගන්නා ලදි (Derive broad laws from the data were seen to exclude the importance of the individual and of individual actions in the past). පුරාවිද්‍යාඥයින් විසින් සොයා ගන්නා ලද බොහෝ භෞතික සංස්කෘතියේ සංකේතාත්මක ස්වභාවය පශ්චාත් සංස්ලේශී පුරාවිද්‍යා ඥයින් විසින් අවධාරණය කරන ලද අතර, ක්‍රියාවලි ක්‍රමවේදයන් පිළිබඳ සවිස්තරාත්මක විවේචන රාශියක් පශ්චාත්-කාලීන පුරාවිද්‍යාව යටතට ගෙන එන ලදී. පුරාවිද්‍යාඥයින් විසින් සොයා ගන්නා ලද බොහෝ භෞතික සංස්කෘතියේ සංකේතාත්මක ස්වභාවය පශ්චාත් සංස්ලේශී පුරාවිද්‍යායින් විසින් තදින් ම තර්කයට බඳුන් කරන ලද

අතර ඇත්ත වශයෙන් ම, මෙම තත්ත්වය පුරාවිද්‍යාඥයින් විසින් වැදගත් ලෙස පිළිගනු ලැබුවේ සංජානන සංස්ලේශී පුරාවිද්‍යාව (cognitive processual archaeology) යටතේ දී ය.

සරල ම මට්ටමින්, පශ්චාත් සංස්ලේශී පුරාවිද්‍යා රාමුවක් තුළ වැඩ කරන ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් විසින් උදාහරණයක් ලෙස, ගල් කවයක හෝ ගල් පේළියක සැලැස්ම පමණක් නොව එය තැන්පත් කර ඇති ආකාරය ද භූමියේ ස්වාභාවික පාෂාණ, කැපී පෙනෙන කඳු මුදුන්, කෙටි හා දිගු දර්ශන ද සටහන් කරනු ලබයි. සන්දර්භය පුළුල් අර්ථයෙන් ගත් කළ එය අර්ථ නිරූපණය තුළ ක්‍රියාත්මක වේ. පුරාවිද්‍යාඥයෙකු යම් ස්ථානයක් ක්‍රමානුකූලව කැණීම්කරන විට කුඩා හා විශාල සෑම අස්ථියක් ම නිශ්චිත තැන්පතුවකින් ලබා ගැනීමට සතුටු වේ. ඇතැම් ඇටකටු හෝ අස්ථි කාණ්ඩ භූමියේ තැන්පත් වී ඇති ආකාරය සහ ඒවා එකිනෙකට හා අනෙකුත් මූලද්‍රව්‍යයන්ට සාපේක්ෂව පිහිටා ඇති ආකාරය සංස්ලේශවාදී නව පුරාවිද්‍යාඥයින් විසින් නිසි පරිදි විග්‍රහ කෙරේ. සංස්ලේශවාදී පුරාවිද්‍යාඥයින් විශාල ක්‍රියාදාමයන් කෙරෙහි උනන්දු වෙයි, පශ්චාත් සංස්ලේශවාදී පුරාවිද්‍යාඥයින් ද අස්ථියක් හෝ පොරවක් ප්‍රවේශමෙන් තැබීම වැනි පුද්ගලයෙකුගේ ක්‍රියාවන් ගැන උනන්දු වෙයි.

භූ ස්ථරය පිළිබඳ අධ්‍යයනය යනු ක්ෂේත්‍ර පුරාවිද්‍යාව තුළ මූලික සංකල්පයක් වන අතර එයට දහඅට වන සියවස දක්වා දිවයන ශක්තිමත් න්‍යායාත්මක පදනමක් ඇත. ජේ. හටන් 1795 දී එඩින්බරෝ හි දී ප්‍රකාශයට පත් කරන ලද Theory of the earth with proofs and illustration ග්‍රන්ථය භූ ස්ථරය පිළිබඳ න්‍යායේ පරිණාමය පිළිබඳ අධ්‍යයනයේ ආරම්භක ලක්ෂ්‍යයකි. කෙසේ වෙතත්, පුදුමයට කරුණක් නම්, බොහෝ පුරාවිද්‍යාඥයින් භූ ස්ථරය පිළිබඳ සංවර්ධනය වෙමින් පවතින ක්‍රමෝපාය සංකල්ප පිළිබඳ න්‍යායාත්මක වැදගත්කම දැක ගැනීමට අපොහොසත් වීමයි.

පුරාවිද්‍යාත්මක ස්ථරීකරණය පිටුපස ඇති මූලික න්‍යාය නම්, මුලින් තැන්පත් කළ පරිදි පතුලේ ඇති ස්තරය පැරණිතම වන අතර ඊට ඉහළින් ඇති සෑම ස්ථරයක් ම ක්‍රමයෙන් අලුත් වේ. අනුක්‍රමයේ ඉහළින් ඇති ස්තරය අලුත් වේ. කෙසේ වෙතත්, පුරාවිද්‍යාත්මක

ස්ථරීකරණයට තවත් බොහෝ දේ ඇතුළත් වේ. පස් ස්ථරවලට අමතරව බිත්ති, වළවල් සහ වලවල් වැනි සංස්කෘතික අතුරු මුහුණත් ද එයට ඇතුළත් ය. එබැවින් කැණීම් වලදී, ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් විසින් කරනු ලබන සෑම අංශයක්ම පාහේ න්‍යායාත්මක වේ. මෙයට සංස්ලේශවාදය (processualism) වැනි පුළුල් න්‍යායාත්මක ප්‍රවේශයන් මෙන්ම ස්ථර අධ්‍යයනය වැනි නිශ්චිත න්‍යායාත්මක සංකල්ප ද ඇතුළත් ය (Drewett 1999:11). කැණීම් නොකරන ක්ෂේත්‍ර කටයුතු ද න්‍යායාත්මක ය. මෙයින් බොහොමයක් ක්ෂේත්‍ර දත්ත අර්ථ නිරූපණය සමඟ බැඳී ඇත. නමුත් න්‍යායාත්මක රාමුව හැර අර්ථ නිරූපණය කිරීම අභියෝගයකි.

උදාහරණයක් ලෙස ඔප දැමූ ගල් ආයුධ බොහෝ ප්‍රදේශවල දී වැඩ කරන ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් විසින් සොයා ගනු ලැබේ. ඒවා බොහෝවිට පුළුල් ලෙස විසිරී ඇත. මෙහිදී සංස්කෘතික-ඓතිහාසික පුරාවිද්‍යාඥයින් ගල් ආයුධ වර්ගීකරණය මගින් කාල නීර්ණය සඳහා ඇති වටිනාකම දකිනු ඇත. සංස්ලේශවාදී පුරාවිද්‍යාඥයින් ඒවා කෘෂිකර්මාන්තය සඳහා වනාන්තර, ගස් කැපීම ඉවත් කිරීමේ මෙවලම් ලෙස දැකිය හැකිය. පශ්චාත්-සංස්ලේශවාදී පුරාවිද්‍යාඥයින්, කාල නීර්ණය සඳහා ඇති වටිනාකම පිළිගන්නා අතර, ඒවා බොහෝ විට භාවිතයට නොගත් ඒවා ලෙස සලකන විට, ඒවා සියල්ල ම අතහැර ඇති ද්‍රව්‍ය ලෙස හඳුනා ගනී. සමහරුන්ට මෙම ගල් මෙවලම් සමග අවම වශයෙන් සංකේතාත්මක හෝ චාරිත්‍රානුකූල කාර්යභාරයක් තිබෙන්නට ඇති බව සිතුවහොත් ඒවා තැන්පත් ස්ථානය සහ තලයෙහි දිශානතිය පවා සැලකිය යුතු ය.

ලැන්ටාවෝ දූපතේ මැන් කොක් හි චීන පුරාවිද්‍යා කණ්ඩායමක් සමඟ නව ශිලා-ලෝකඩ යුගයේ ජනාවාස වටා ක්ෂේත්‍ර සමීක්ෂණයක් සඳහා වැඩ කරන විට ජනාවාසයට ඉහළින් කන්දෙන් ඔප දැමූ ගල් පොරෝ දෙකක් හමු විය. නව රාමුවක් තුළ වැඩ කරමින්, කණ්ඩායම ප්‍රවේශමෙන් පොරෝවල පිහිටීම හා දිශානතිය (position of the axes in the landscape) පවා සටහන් කර ගැණුනි (Drewett 1999:12).

කෙසේ වෙතත්, ඔබ වැඩ කරන්නේ න්‍යායාත්මක රාමුවක් තුළ නම් ඉදිකිරීම් සහ කෞතුක වස්තු යන දෙකෙහි ම සංකේතවාදයේ

විභවය හඳුනා ගන්නා අතර, භූ දර්ශනයේ විවිධ අවකාශයන් අතර මායිමක්, බෙදීම් රේඛාවක් ලෙස ඉවුරු හෝ වළවල් දැකිය හැකිය. මෙම අවකාශයන් ස්වාභාවික භූ දර්ශනයට සම්බන්ධ වන්නේ කෙසේද යන්න ඔවුන්ගේ අවබෝධය තුළ තීරණය වේ.

සමහර ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින් කියා සිටින්නේ යමෙකු හුදෙක් විෂය මූලික සහ සියල්ල වාර්තා කළ යුතු බවයි. පැහැදිලිවම එවැනි ප්‍රවේශයක් කාලය හා මුදල් අතින් යථාර්ථවාදී නොවේ. නමුත් සියල්ල යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? 1920 ගණන්වලදී පුරාවිද්‍යාත්මකව අදාළ යැයි සිතන සෑම දෙයක්ම සටහන් කරන ලදී. පුරාවිද්‍යාව වඩා තවත් බොහෝ දේ අදාළ විය හැකි බව දැන් අපට වැටහී ඇත. පුරාවිද්‍යා ප්‍රදේශවල සහ කෞතුක වස්තුවල පිහිටීම සහ දිශානතිය ඒවායේ අනුපිළිවෙල සහ කාලය ද ඉතා වැදගත් විය හැකිය. ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයින්ගේ න්‍යායාත්මක ඉදිරි දර්ශනය සෑම විටම ඔහු හෝ ඇය ක්ෂේත්‍ර පුරාවිද්‍යාව පුහුණු කරන තැන අනුව තීරණය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Drewett Peter L.,2001, Field Archaeology: An Introduction, University College London

Greene Kevin, 1995, Archaeology an introduction, Routledge

Greene Kevin and Moore Tom,2010, Archaeology an Introduction, Routledge

Joukowsky Martha, 1980, A complete Manual of field Archaeology, United States of America

Renfrew Colin, Bahn Paul, 1991, Archaeology Theories, methods, and practice. Thames & Hudson Ltd, London

Rouse, I. 1992. The Tainos. New Haven, Connecticut: Yale University Press

The Concise oxford dictionary,1985, 7th edition, Oxford University Press

Webster International Dictionary,1986, (Ed.) Philip Babcock Gove, 3rd Edition, Merriam-Webster, Inc.